# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

කේ. උපුල් ධම්මික,
අංක 29/29,
B D M කොළඹගේ මාවත,
3 වන පටුමග, කිරුළපන,
කොළඹ 05.

අභියාචක

**අභියාචනා අංකය : 944/2021**

**-එදිරිව-**

නාගරික සංවර්ධන අධිකාරිය,
6 වන හා 7 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පොදු අධිකාරිය

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : දෙපාර්ශවය පෙනී නොසිටි.
පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2018.12.26, 2021.11.23
පොදු අධිකාරිය - 2021.10.01

**විභාග කළ දිනය** : 2019.09.30, 2020.01.13, 2021.01.26, 2021.09.14, 2021.03.03

**තීරණය කළ දිනය** : 2022.03.03

## තීරණය

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2018.09.18 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"1. ඔෂන් විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව පිහිටුවන ලද සමාගමක්ද?*

*2. එම සමගම සංස්ථාපනය කර ඇත්තේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේද?*

*3. පිළිතුර ඔව් නම් ඔෂන් විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමේ Articles of Association and Memorandum of Association රෙගුලාසිවලට අනුව කොටස් බෙදී යන ව්‍යුහය කුමක්ද? (ප්‍රතිශතයක් වශයෙන්)*

*4. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොටස් ප්‍රමාණය අනුව පත් කළ හැකි අධ්‍යක්ෂවරු සංඛ්‍යාව කොපමණද?*

*5. දැනට පත් කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ නම්,ලිපිනයන්, සහ සුදුසුකම් කවරේද ? (වගුවක ආකාරයෙන්)*

*6. එම සියලු අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා නිර්දේශ දෙනු ලැබුවේ මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාද?*

*7. පිළිතුර නැත නම්, එකී අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා යොදා ගැනුණු නිර්ණායක මොනවද?*

*8. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පරිච්ඡේද අංක XIX සහ ආ වගන්තියේ 156 උ අනු ඡේදය යටතේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති, එහෙත් රජයට අයත් සංස්ථාවක් අධිකාරියකට 50% කට වඩා වැඩි කොටස් අයිතිය ඇති රජය සතු සමාගම්ද "රජයේ ආයතන" ලෙස අර්ථ නිරූපණය කර ති බව පිළිගන්නේද?*

*9. උත්තරීතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රජයේ ආයතන වශයෙන් ඉහත අර්ථ නිරූපණය කර ඇති ආයතන රජයේ මුදල් නීති සංග්‍රහය, ආයතන නීති සංග්‍රහය, ප්‍රසම්පාදන නීතිය අනුගමනය කළ යුතු බවත් පිළිගන්නේද ?*

*10. ඔෂන් විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම රජයේ ආයතනයක් ලෙස පිළිගනු ලබන්නේද?*

*11. පිළිතුර නැත නම් හේතු දක්වන්න.*

*12. වර්තමානයේ මෙම සමාගමේ සභාපතිවරයා ඔෂන් විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම රජයේ සතු සමාගමක් නොවන බවත්, පුද්ගලික සමාගමක් ලෙස සලකමින් පාලනය පාලනය ගෙන යන අතර, නිවාස හා ඉදි කිරීම් අමාත්‍යංශයේ ස්ථිර ලේකම්වරයාට පවා වගකීමක් නොමැති බව ප්‍රකාශ කරන බව ඔබ දන්නේද?*

*13. වර්තමානයේ මෙම සමාගමේ සභාපතිවරයා විසින් සිදු කරනු ලබන මූල්‍ය අවභාවිතාවන් සම්බන්ධයෙන් උසස් නිලතල කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී ඇති බව ඔබ දන්නේද ?*

*14. සමහර දූෂණ සහ වංචා සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර ඇති බව ඔබ දන්නේද?*

*15. තත්වය එසේ නම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් පත් කරන ලද අධ්‍යක්ෂවරුද සාමූහික වගකීම යටතේ මෙම මූල්‍ය අවභාවිතාවන් වලට වගකිව යුතු බව පිළිගන්නේද?*

*16. පිළිතුර ඔව් නම් , නාගරික සංවර්ධන අධිකාරිය පත් කරන ලද අධ්‍යක්ෂවරු, මූල්‍ය හා දූෂණවලට උපකාර කර හෝ සහය දී ඇත්නම්, පත්කිරීමේ බලධාරියා ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ නිර්ණායක ලබා දුන් අදාළ අමාත්‍යවරයා වගකිව යුතු බව පිළිගන්නේද?*

*17. ඕෂන් ව්‍යූ ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම පිහිටුවා ඇති ටවර් ගොඩනැගිල්ල සහ එහි භූමිය නාගරික සංවර්ධන අධිකාරියට අයත් බව පිළිගන්නේද?*

*18. එම භූමිය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් ස්ථාපිත කරන ලද ඕෂන් ව්‍යූ ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම වෙත වසර 99 ක් සඳහා බදු ගිවිසුමක් යටතේ පවරා දී තිබේද?*

*19. බදු ගිවිසුමක් යටතේ ඕෂන් ව්‍යූ ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමට පවරා දී ඇති භූමියේ ටවර් ගොඩනැගිල්ල අදියර II වශයෙන් තට්ටු 60ක සහධිපත්‍ය ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් කර ඇති බව ඔබ දන්නේද?*

*20. ඒ සඳහා ආයෝජන වශයෙන් ආයෝජකයින් ලියාපදිංචි කර ඇති බව දන්නේද?*

*21. එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් භූමියේ අයිතිකරු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගෙන හෝ දැනුම් දීමක් කර ඇතිද?*

*22. එම ගිවිසුමේ සහතික කරන ලද පිටපතක් ලබා දෙන්න.”*

තොරතුරු නිලධාරි නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර නොදැක්වූ බැවින් අභියාචක විසින් 2018.10.15 දිනැතිව නම්කල නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කල නිලධාරි ද නියමිත කාල සීමාවන් තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2018.11.21 දිනැතිව දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

අභියාචක විසින් 2018.12.26 දිනැති ලිපිය මගින්, නම්කළ නිලධාරී තොරතුරු අයිතිවාසිකම් පිලිබඳ පනතට අනුව කටයුතු කර නොමැති බව කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

2019.07.04 දිනැතිව තොරතුරු ඉල්ලීම භාරගත් බව දැන්වීම ලෙස සඳහන් ලිපිය මගින්, අභියාචක විසින් ඉල්ලා ඇති කරුණු 22 අතුරින් සමහර තොරතුරු එනම් අයිතම් අංක 1, 2, 3, 6, 9, 17, 18, 19, 20 සහ 21 ට අදාළ තොරතුරු ලබා දී ඇති බව 2021.09.14 වන දින අභියාචනා විභාගයේදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

පොදු අධිකාරිය විසින් 2021.10.01 දිනැති ලිපිය මගින්, කොමිෂන් සභාවට පිටපත් සහිතව, අභියාචකගේ තොරතුරු ඉල්ලීමෙහි අයිතම අංක 4, 5, 7 සහ 22 සඳහා තොරතුරු අභියාචක වෙත ලබා දී ඇති බව කොමිෂන් සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කර ඇත.

අභියාචක විසින් 2021.11.23 දිනැති ලිපියක් මගින් පහත කරුණු කොමිෂන් සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කර ඇත.

*“මා විසින් ඉල්ලා ඇති තොරතුරු වලට අදාළව අයිතම් අංක 4, 5, 7 සහ 22 දරණ තොරතුරු ඔබ කොමිෂන් සභාවට ද පිටපතක් සහිතව මා වෙත 2021.10.01 දිනැති ලිපිය මගින් ලබා දී ඇති බව වාර්තා කරමි.”*

**සලකා බැලීම**

අභියාචක විසින් තමන් ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියෙන් ප්‍රතිචාර ලැබී ඇති බවට පිළිගනී.

ඒ අනුව මෙම අභියාචනය අවසන් කළ හැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරයි.

මෙම නියෝගය අභියාචක වෙත, තොරතුරු නිළධාරි වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.